DOI: https://doi.org/10.4038/p.v15i2.20
*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 15-Iss. II, Dec. 2024, 98-113.*

# රජරට ශිෂ්ටාචාර සමයෙහි භාවිත යුධ උපකරණ පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

# [An Archaeological Study of the Military Equipment Used in the Rajarata Civilization Period]

**Ulpathagama Amitharathana**[1]

**Abstract**

The stability and peace of a political environment play a crucial role in the developmental trajectory of any nation. Historical accounts and genealogical records from Sri Lanka illustrate how periods of political tranquility have facilitated significant cultural and urban developments. Notably, the reign of King Vijaya marked the genesis of a more structured urban culture, which indicated further sophistication by the era of Pandukabhaya.From the Anuradhapura to the Polonnaruwa periods, both rulers and commoners in Sri Lanka faced numerous invasions. These challenging times demanded robust defense mechanisms, placing a significant onus on the role of blacksmiths within the state apparatus. These skilled artisans were pivotal in manufacturing weapons, which were critical for the state's survival and governance.The prehistoric inscriptions reveal that blacksmiths also played a vital role beyond weapon production. They were involved in carving out cave residences for monks and making religious offerings, indicating their integral role in both the secular and religious aspects of life. These artisans were referred to as "Kabara," a testament to their esteemed position in society. The importance of blacksmiths is further underscored during the historical conflicts such as the war between King Elara and King Dutugemunu. Records from this period mention the extensive use of weapons and the melting of metals to produce tools for warfare. Such accounts highlight how critical iron extraction and tool manufacturing were to the country's defense capabilities.This historical narrative confirms that the contribution of iron workers went beyond mere craftsmanship; they were indispensable in shaping the security landscape of the nation, thus playing a crucial role in the development and sustenance of Sri Lanka through turbulent times.

**Keywords**: Bows, Spears, Spikes, Swords

1. Sub -Warden, Bhiksu University of Sri Lanka.
E-mail: uamitharathana@gmail.com https://orcid.org/0009-0008-1796-4822

Received: 7 July 2024, Accepted revised version: 22 Dec. 2024.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

### හැඳින්වීම

ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමත් සමඟ බෞද්ධ භික්ෂූන් ප්‍රධාන කොටගත් පාලන තන්ත්‍රයක් මූලාරම්භයේ සිට ම ලාංකේය ඉතිහාසයේ දක්නට ලැබේ. මුල් ඓතිහාසික යුගයට අයත් මූල බ්‍රාහ්මී ලිපිවල සඳහන් පරුමක, ගහපති, බත, බරත, අෂ යන ජන කණ්ඩායම් පරිපාලන වශයෙන් රජුට සහාය දැක් වූ පිරිස් වශයෙන් හඳුනාගැනීමට හැකි ය. මෙහි දී සිදු වන සමාජ ස්තරායනයත්, විශේෂ කාර්මික ශ්‍රේණි බිහිවීමත් ශිල්පීය ප්‍රාගුණ්‍යතාවලින් බිහිවන වාරි මාර්ගත්, නාගරික ලක්‍ෂණත් මේ යුගයේ විශේෂ ලක්ෂණ වේ. රටෙහි දේශපාලන ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අවි ආයුධ නිෂ්පාදනයට යකඩ තාක්ෂණය බෙහෙවින් ඉවහල් වී තිබේ. පාරම්පරික දේශීය යකඩ කාර්මික ජනතාව පශ්චාත්කාලීන ව කුල ක්‍රමය අනුව සකස් වූ ශිල්ප ශ්‍රේණි කිහිපයකට බෙදී තිබිණ. යපස් හා යගල් භාවිතයෙන් යකඩ තැනීම යමන්නෝ විසින් ද ගෘහ හා කෘෂි උපකරණ නවන්දන්න කුලය විසින් ද සිදු කර ඇත. මෙම කර්මාන්තය හා ශිල්ප ශ්‍රේණි 10 හැර පට්ටල් 04ක් ද විය. මෙම පට්ටල් හතර රජුට පමණක් සේවය කළේ ය. පට්ටල් භාර ව කටයුතු කළේ "මූලාචාරී" නම් නිලධාරියාය (කුමාරස්වාමි, 1913).

### පර්යේෂණ ගැටලුව

රජරට ශිෂ්ටාචාර සමයට අයත් යුධ උපකරණවල උපයෝගිතාව කෙබඳු ද?

### පර්යේෂණ අරමුණ

ශ්‍රී ලංකාවේ වාසය කළ අතීත රජ දරුවන් විසින් සතුරු ආක්‍රමණ පරාජය කොට රට එක්සේසත් කිරීම සඳහා භාවිතයට ගන්නා ලද විවිධ වර්ගයට අයත් යුධ උපකරණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

### පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විධිමත් පර්යේෂණ ශිල්ප ක්‍රම යොදාගත යුතු බැවින් මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික වශයෙන් භාවිත කරන ලදි.

- පුස්තකාලය අධ්‍යයනය
- ක්ෂේත්‍ර ගවේෂණය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල සතු කැණීම් භූමිවලින් හමු වී ඇති ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු විධිමත් අවසරයකින් ක්ෂේත්‍රයට ගොස් අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම
- ඉහත සඳහන් පර්යේෂණ ක්‍රම ශිල්ප භාවිත කරමින් පර්යේෂණය සිදු කරන ලදි.

### සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ භාවිත යුද උපකරණ සම්බන්ධයෙන් තොරතුරු විමර්ශනය කිරීමේ දී ඒ සම්බන්ධයෙන් මුල් ම සාධකය හමුවන්නේ මහාවංසයේ විජය කුවේණි කතාපුවතෙන් ය. විජය කුමරු ඇතුළු පිරිස ලංකාවට ගොඩබැසීමෙන් අනතුරුව සීසපානි නැමැති යකින්න විසින් විජය කුමරුගේ හත්සියයක් පිරිස අතුරුදන් කෙරිණි. ඔවුන් ආපසු නොපැමිණි විට විජය කුමරුන් භයෙන් තැතිගෙන පංචායුධයෙන් සන්නද්ධ ව ගොස් මෙම යකින්න මාගේ ජාතිය දනී නිශ්චය කොට වහා තම නම කියා දුන්න ද රැගෙන ඇය වෙත ගොස් ගෙලෙහි වූ යකඩ වළල්ලෙන් ඇද වමතින් කෙස්වැටිය ගෙන දකුණතින් කඩුව ඔසවා දැන් ම මගේ පිරිස දෙන්න යැයි තර්ජනය කළ බව සඳහන් වේ (මහාවංසය, 7 : 10-23). එමෙන් ම පණ්ඩුකාභය රජු සිය මාමාවරුන් සමඟ යුද කොට ඔවුන් මරණයට පත් කොට ජයග්‍රණය ලැබූ බව සඳහන් වේ (මහාවංසය, 10 : 85-87).

දේවානම්පියතිස්ස රජුගේ ඇවෑමෙන් උත්තිය, මහාසීව, සූරතිස්ස, සේන, ගුත්තික හා එළාර යන රජවරුන් මෙරට පාලනය කළහ. එම කාල පරිච්ඡේදය තුළ විවිධ අවස්ථාවල ඔවුන් අතර, යුද කටයුතු සිදු ව තිබේ. දුටුගැමුණු රජු දමිළයන්ගෙන් රට බේරාගැනීම සඳහා එළාර රජු සමඟ ද්වන්ද සටනක් ආරම්භ කරන ලදි. ''ඒ අනුව සිය පිරිවර සමඟින් නුවරින් නික්ම දෙමළ යෝධයන් සමග යුද කොට විජිත නගරයට පැමිණ නගරය අවහිර කොට කණ්ඩුල හත්ථිරාජයාට අණ කර යදොර බිඳ නුවරට පිවිස එයින් නික්ම ගිරිලෝහ, මහේලක හා අනුරාධපුර යන නගර තුන පිළිවෙළින් අල්ලා ගෙන අනුරාධපුරයට පැමිණ දමිළයන් හා යුද කරමින් ජයගෙන සියලු දමිළයන් යුදබිමෙහි ම මරා දැම්මේ ය.'' මෙම ද්වන්ද සටනේ දී තියුණු වජ්‍ර අංකුසය, තෝමර, කඩු, දුනු, ඊතල හා ලෝහ උණු කර සතුරන්ට පහර දීමට භාවිත කළ බව ද මෙම යුද කටයුතු වෙනුවෙන් ඇතුන් සහ අශ්වයන් යොදාගත් බව දක්වා තිබේ. ඔවුන් සඳහා භාවිත කරන ලද අශ්ව ලාඩං බොහෝ ප්‍රමාණයක් ක්ෂේත්‍රයෙන් හමුවේ. එමෙන් ම දමිළයන් සමග වේළුසුමන යුද වදින ලද නැගෙනහිර දොරටුවෙහි ද බිහිසුණු යුද්ධයක් විය. ඇතුන් පිට නැගුණු දහස් ගණන් දමිළයෝ වේළුසුමන සමඟ යුද පිණිස නගරයෙන් නික්මුණහ. ගැනීමට නොහැකි තරම් දමිළයෝ ඒ යුද බිම සමූහ වශයෙන් මරනු ලැබූහ. ඒ දුටු දමිළයෝ නුවර දොරටු වසා දැමූහ. රජු කණ්ඩුල නන්දිමිත්ත හා සුරනිමල දකුණු දොරටුවෙහි යුද පිණිස යැව්වේ ය. මහාසෝණ, ගෝඨ හා ථෙරපුත්ත යන තිදෙන ඉතිරි දොරටු තුනෙහි යුද්ධ සංවිධාන කළහ. විජිත නගරය වටා කලල්, දිය හා මත්ස්‍යයන් පිරි ගැඹුරු අගල් තුනක් විය. දමිළයන් විසින් මැනවින් රකින ලද මෙහි ප්‍රාකාරය ඉතා උස් විය. යකඩෙන් කළ දොරවල් සතුරන් විසින් විනාශ කළ නො හැකි ය. පිටත භාත්පස බළසෙන් රැඳවූහ. කණ්ඩුල ඇතා ශිලාස්තම්භය වෙත ගොස්, දෙදණින් නැමී ශිලා ස්තම්භය බිඳ දෙදළින්, සුදුහුණෙන් කපරාරු කළ ගඩොල් ද බින්දේ ය. ක්‍රමයෙන් උත්සාහ කොට යකඩ දොර වෙත ළං වූයේ ය. ගෝපුරයෙහි සිටි දමිළයෝ දහස් ගණන් ආයුධ වැස්සක් මෙන් ඇතු පිට හෙළූහ ගිනි අඟුරු මෙන් දිදුලන යගුලි විශාල අඬුවලින් ගෙන හෙළූහ. මඩ හා ලාටු කොටස් වශයෙන් වැසිවතුර මෙන් ඇතුපිට වත් කළහ (මහාවංසය, 25 : 45-67). යනුවෙන් දක්වා තිබේ.

ආමණ්ඩගාමණී රජුගේ කාලයෙහි රජු බළසෙනගට සංග්‍රහ කොට යුද්ධය පිණිස නික්මුණේ ය. ඒ ලම්බකර්ණයෝ යුද්ධය සඳහා පිටත් විය. කපාලකන්දද්වාරයෙහි හංකාරපිට්ඨි කෙතේ දී ඔවුනොවුන් පෙළන ඔවුන් දෙදෙනාගේ යුද්ධය පැවතුණේ ය. නැව් ගමණින් වෙහෙසට පත්ව සිටි රජුගේ මිනිස්සු යටත් වූහ. එහෙයින් රජු සිය නම හඬගා කියා තමා ම යුද්ධයට එළඹුනේ ය. ඒ හඬින් බියපත් වූ ලම්බකර්ණයෝ මුණින් වැතුරුණහ. රජු ඔවුන්ගේ හිස් සිඳ රථනාභිය තෙක් ගොඩනැසූහ (මහාවංසය, 35: 33-36). කාශ්‍යප රජු විසින් තම පියා වූ ධාතුසේන රජු අත් අඩංගුවට ගෙන රජු නිරුවත් කොට විලංගු ලා පෙරදිගට මුහුණ ලා බිත්තියෙහි බැද මැටි ගැස්ස වූ බව සඳහන් වේ (මහාවංසය, 38: 109-111). එමෙන් ම මුගලන් රජ වීමෙන් පසුව තම පියාගේ ඝාතනයට සම්බන්ධ ඇමති පිරිසගේ කන් නාසාදිය කැප්ප වූ බව ද එසමයෙහි සිලාකාල හට අසිග්ගාහක තනතුර ලබා දී ආරක්ෂාව සැලසූ බව සඳහන් වේ (මහාවංසය, 39: 34-54). එමෙන් ම කාශ්‍යප රජු පැන යන බව අසා සිලාකාල වහා පැමිණ ඔවුන් වට කළහ. එහි යුද්ධයක් ඇති වූ අතර, කාශ්‍යප රජු සිය හිස සිඳ ඇත් ගොච්චාට දී අසිපත ලේ පිස කොපුවෙහි බහා ඇත්කුඹ මත දෙඅත් තබා වැතුරුණේ ය (මහාවංසය, 40 : 23-25). අග්ගබෝධි රජු ද සංඝභද්දට අසික්ගාහක තනතුරක් ප්‍රදානය කරන ලද බව සඳහන් වේ (මහාවංසය, 41: 42). දප්පුල රජු සතුරන් පරාජය කිරීම සඳහා සියලු ආයුධ ශිල්පයන්හි

විශාරද කෘතහස්ත සේනාවක් ලබා දුන් බව සඳහන් වේ (මහාවංසය, 46: 152).

මහාදිපාද සේන රජුගේ කාලයෙහි දොරවල් අවුරා යැම් ඊම් නවතා ඉක්බිති අට්ටාල ගෝපුර හා බල කොටු ගිනි තැබූහ. මෙසේ සිංහල සේනාව සිය නුවරට ඇතුළු වී බලසෙන් නසමින් සියල්ල වනසන බව අසා පණ්ඩු රජු සිය සේනාව රැගෙන සිංහල සේනාව කරා පැමිණ යුද්ධ කිරීමට පටන් ගත්තේ ය. අසම්පූර්ණ බලසෙනඟක් සහිත ඔහු ඇතු පිට සිටියදී ම ඊයකින් විදිනු ලැබ සිය නුවර පලාගොස් ගියතැන දී සියදිවි නසා ගත්තේ ය (මහාවංසය, 49: 33-38). උදය රජුගේ කාලයේ සංග්‍රාමය සඳහා දක්ෂ දුනුවායෙක් යැවූ බව ද මහින්ද යුවරජුගේ සේනාව තැන තැන මරා දැමූ බවත් යුද කටයුතු සඳහා ඇතුන් හා අශ්වයන් යොදා ගැනීමත් සිදු කොට තිබේ (මහාවංසය, 49 : 111-114). මහින්ද රජුගේ කාලයෙහි වැටුප් නොලැබූ සේවක පිරිස වැටුප් ලැබෙන තුරු අවියෙන් සන්නද්ධ ව දුනුගත් අතැතිව රජමාළිගය දොරටුවේ සිටි බව ද චෝල රජු දොළොස් හැවිරිදි ඒ කුමරු ගැන අසා ඔහු අල්ලා ගැනීම සඳහා බලවත් මහ ඇමතියන් එවී ය. යෝධයන් අනූපන්දහසක් රැගෙන ඔවුහු සියලු රුහුණු දේශයේ ඒ ඒ තැන් කැළඹූහ. ඉක්බිති යුද්ධෝපායෙහි දක්ෂ වූ මහාවීර වූ මක්ඛකුදෲසවාසී කිත්ති නැමති ඇමතිවරයා ද එසේ ම මාරගල්ලවාසී වූ බුද්ධ නම් ඇමතිවරයා ද යන දෙදෙනා චෝල සේනාව විනාශ කිරීමට තදින් ම නිශ්චය කොට පලුට්ඨගිරි නම් තැන දුර්ගයෙහි කඳවුරු බැඳ මාස හයක් යුද කොට බොහෝ දමිළයන් විනාශ කළහ. ඉතිරි වූ චෝලයෝ එම යුද්ධයෙහි දී බියෙන් මිරිකී පලා ගොස් පෙර පරිදි පොලොන්නරුවෙහි විසූහ (මහාවංසය, 53: 24-30).

විජයබා රජු මහවැලි ගඟ ඔස්සේ යමින් මහියංගනය ස්තූපය සමූහයේ සේනාව නවත්වා මඳ කලක් එහි විසුවේ ය. සුදුසු ස්ථාන ගැන දන්නා මහාවීර වූ රජු ක්‍රමයෙන් පැමිණ පොලොන්නරුව අසළ උසස් වූ ස්ථිර වූ කඳවුරක් බැඳ ඒ ඒ තැන සිටි සූර වූ සොළීහු යුද කරනු පිණිස පොලොන්නරුවෙහි රැස්වූහ. නගරයෙන් නික් ම සොළීහු පිටත දී මහා යුද්ධයක් කොට පරාජය වී බියට පත්ව සිය නගරයට පිවිස සියලු පුර දොරටු වසා ගෝපුර අට්ටාලවලට වී බොහෝ උත්සාහයෙන් බිය එළවනසුලු මහා යුද්ධයක් කළහ. නගරය වටකරගෙන මසකුත් අඩමසක් යුද කරන රජුගේ මහා සේනාව බලාපොරොත්තු ඉටු කරගන්න අසමත් විය. මහ රජුගේ මහාවීර වූ මහා බල ඇති මහා සූර වූ රවිදේව, චල ආදි වූ මහායෝගයෝ පවුර පැන වහා නගරයට පිවිස ක්ෂණයකින් සියලු දමිළයන් ඝාතනය කළහ (මහාවංසය, 56: 49-56). එමෙන් ම ඒ සියල්ලෝ රුහුණු රට ද මලය මණ්ඩලය ද සියලු දක්ඛිණ පස්සය ද පෙරළා දැමූහ. දක්‍ෂ වූ බලඇති රජු රුහුණට මෙන් ම මලයමණ්ඩලයට ගොස් ඒ ඒ තැන බොහෝ සතුරු ජනයා ඝාතනය කරමින් මැනවින් එය සංසිඳුවා ඇමතිවරුන් එහි නවත්වා දක්ෂිණ දේශයට ගොස් සමණිභාතු වංශයෙහි උපන් ඇමතිවරයෙකු යවා දරුණු යුද්ධයෙහි දී සිය සතුරන් අල්ලා උල හිඳුවා ලංකාව සතුරන් නැමති කටු නැති තැනක් කොට පොලොන්නරුවට අවේය (මහාවංසය, 57: 18-22). තමාගේ රටට සිංහල දූතයන් පැමිණි කල චෝල රජු වහා ම ඔවුන්ගේ කන් හා නාස කපා විරූපී බවට පත් කළේ ය. විරූපී වූ ඔවුහු මෙහි පැමිණ තමන්ට චෝලයන් කළ සියල්ල රජුට කිවූහ (මහාවංසය, 58: 27-28).

පිය රජුගේ අදහස අනුව පරාක්‍රමබාහු කුමරු හස්තිශිල්ප ආදියෙහි ද කඩු, දුණු ආදි නොයෙක් ශිල්පයන්හි ද විශේෂයෙන් ආයුධ ශිල්පයෙහි ද පරතෙරට පැමිණ සිටි බව සඳහන් වේ (මහාවංසය, 62: 1-5). එමෙන් ම බුද්ධිමත් කුමරු ඔවුන් කෙරේ මඳකුදු සැකයක් නොකොට සිය අත වූ කඩුවෙන් යුද කොට සතුරන් පළවාහැර අනුගාමිකයන් රැගෙන පැමිණි බව ද (මහාවංසය, 64: 21-25). කුමරුගේ භටයෝ තියුණු උල් කටු වැටක්

වෙත ළඟා විය. එහි ඇතුළුවීමට නොහැකි ව පිටත සිටි බව සඳහන් වේ (මහාවංසය, 46 78-87).

පරාක්‍රමබාහු රජු රටෙහි ගල් වඩුවන් නො වූ හෙයින් ලෝහ වැඩ කරන්නවුන් ද බොහෝ රන්කරුවන් ද රැස් කර ඔවුන් ගල් ඇතිරවීමේ කාර්යයෙහි යෙද වූ බව සඳහන් වේ (මහාවංසය, 66 : 25-27). එමෙන් ම රජු විසින් දැන් මම ලංකාව එක්සේසත් කොට ලොව හා සසුන නගා සිටුවන්නේනම් මැනවි. මෙසේ සිතා බලසෙන් හා යුධ උපකරණ රැස් කිරීම සඳහා සාමන්තයන්ට හා මාණ්ඩලිකයන්ට උපදෙස් දුන්හ. රජු මුලින් ම රත්තකුරවක රට දමිළයන්ට නායක වූ මලය රජ නැමැත්තා කැඳවා දහස් ගණන් භටයන් ද ඔවුන්ට සන්නාහ හා ආයුධ සම්පාදනය කරගෙන එහි ම වාසය කිරීම සඳහා යැව්වේ ය. තබ්බරටෙහි ද, ගිරිබා රටෙහි ද, මෝරවැව ද, මහීපාල නැමති රටේ ද, පිළ විට්ටික රටෙහි ද, බුද්ධගාම රටෙහි ද, අම්බවන නම් රටෙහි ද, බෝධිගාමවර නම් රටෙහි ද, කණ්ටකපේටක රටෙහි ද ප්‍රත්‍යන්ත පාලක ඇමතිවරුන් වෙන් වෙන් ව අමතා නොයෙක් දහස් ගණන් බටයන් ද, බලකොටු ද, සන්නාහයන් ද, කඩු, තෝමර, කුන්ත ආදි විවිධ ආයුධ සම්පාදනය කොට ඒ ඒ තැන වාසය කිරීම පිණිස යැව්වේ ය. එමෙන් ම ලංකාමහාලාන, සිබානායක, ජයමහාලාන, සෙට්ඨිනායක, මහින්ද යන නම් ඇති ලම්බකරණ වංශයෙන් පැවැත ආ මෙම පස්දෙනා එකල මෝරිය රටෙහි වාසය කළහ. රජු ඔවුන් ලවා භටයන් දහස් ගණනක් වෙන් වෙන් ව රැස්කරවා යුද උපකරණ තනවන්නට නියෝග කළේ ය. මහත් සිරුරු හා මහත් බල ඇති දහස් ගණන් මිනිසුන් මුගුරු දරන බටයන් බවට පත් කර යුද උපකරණ ද දුන්නේ ය. දහස් ගණන් වැද්දන් කර්මාන්තයන්හි දක්ෂයන් කොට ඔවුන්ට ගැලපෙන ආයුධ ලබා දුන්නේ ය. නොයෙක් කුලවතුන්ගේ පුතුන් සහෝදරයන් හා මුනුබුරන් හස්ති, අශ්ව හා කඩු ශිල්පයෙහි ද ප්‍රගුණ කරවී ය. ප්‍රධාන ඇමතිවරුන් දෙදෙනා යටතේ යුද උපකරණ හා දහස් ගණන් බලසෙන් ද ඇති කරවී ය (මහාවංසය, 67 : 1-34).

පූජාවලියෙහි ශ්‍රී ලංකාවේ අතීත රජවරුන් විසින් සිදු කරන ලද යුද කටයුතු සම්බන්ධයෙන් තොරතුරු සඳහන් කර තිබේ. ''මෙසේ ලක්දිව පරසතුරන් සාදා රට සමෘද්ධිමත් කරවමින් සිටි කල්හි නැවත තමන්ට එකොළොස් වැන්නෙහි බෞද්ධයම්හයි මායම් කියා ලක්ෂ ගණන් නච්චම්බු නම් වූ විෂකොහොල් ගෙන සර්පසේනාවක් සේ ඒ ඒ තොටින් බැස ලක්දිව ගලාගෙන ගිනිසෙණ ගැසූ මගදියසෙණ ගැසුවා සේ ලක්දිව නැවත නැවත නසන්නට පටන් ගත් චන්ද්‍රභානු නම් රජහු හා ජාවක මහසෙනඟ ද අසුර යුද්ධ කරන්නා සේ නොයෙක් යුද්ධ කරවා මරා ලුහුබැඳ මෙසේ මලල යුද්ධය, ද්‍රවිඩ යුද්ධය, ජාවක යුද්ධය යනාදි නොයෙක් යුද්ධයෙහි මෙසේ සිරිලක පරසතුරන් ජය ගෙන ඒකාතපත්‍ර කොට (පූජාවලිය, 2014 : 512).

සාම කාලයන්හි දී යුද්ධ වෘත්තිය සඳහා යුද්ධාභ්‍යාස මඟින් සෙබළු පුහුණු කරන ලදහ. පරාක්‍රමබාහු තම භටයන්ගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා වීථිවල සටන් පිළියෙල කොට දක්ෂ යුද්ධ භටයන් තෝරාගෙන සටන් කිරීමට අයෝග්‍ය අය ඉවත් කර දැමුයේ ය. අනතුරු ව පරාක්‍රමබාහු රජු තමන්ගේ විශාල සේනාව ද ධන ධාන්‍ය ආදි සම්පත් ද යුද උපකරණ ද යන සියල්ල දැක සිංහල දිවයින් පමණක් නොව දඹදිව ද අල්ලා ගැනීමට හැකිවන බව දක්වා තිබේ. මෙම ප්‍රකාශය මඟින් දක්නට ලැබෙනුයේ යුද්ධ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණයටත් වැඩියෙන් මෙරට යුද උපකරණ තිබූ බව ය. මෙම උපකරණ භාවිත කොට දුම්බර රට අල්ලා ගත්තේ ය. අනතුරු ව යට්ඨිකණ්ඩ නම් තැන දී යුද්ධ කොට සතුරන් පලවා හැර දුම්බර රට අල්ලාගත්තේ ය. අනතුරු ව ඔහු යට්ඨිකණ්ඩ නම් තැන දී යුද්ධකොට සතුරන් පළවා හැර සාමන්තයාගේ හිස සින්දේ

ය. තාලබෙත්ත ගමෙහි යුද්ධ දෙකක් කර නාගපබ්බත ගමෙහි ද යුද්ධ දෙකක් කළේ ය (මහාවංසය, 68 ඃ 1-11).

ඉන් පසු ව ගජබාහු රජු සීකාදණ්ඩනාථ ආදි වූ යෝධයන් හා මහා බලසෙනගක් ඔහු සමග යුද්ධ කිරීමට යැව්වේ ය. ඔවුහු සියල්ලෝ බළවාහන සම්පන්න ව නික්ම ගොස් ඒ ඇළගමුව බලකොටුවට ඊතල, තෝමර, සිරීස ආදියෙන් බොහෝ සතුරන් විනාශ කළහ. මෙසේ මහත් උත්සාහය ඇති ඔවුහු දින තුනක් නිරන්තරයෙන් මහත් වූ යුද්ධයක් කළහ. සතුරන් නැසීමේ යෙදුණු ගජබාහු රජුගේ යෝධයෝ බලකොටුවෙහි මහ දොරවල් බිඳින්නට පටන් ගත්හ. එකල රජුගේ නියෝගයෙන් ඇත්, අස්, රථ, පාබල සේනාවට ගමන් කළ හැකි යකඩ තහඩුවලින් සම්බන්ධ කළ රියන් දෙසීයක් දිග හා රියන් විස්සක් පළල ශක්තිමත් දැව පාලමක් කාළවාපි නදියෙහි ඉදිකරවී ය (මහාවංසය, 68 ඃ 113-128).

ගුරුළුගෝමින් විසින් සම්පාදිත අමාවතුර නම් කෘතියේ යක්ෂ දමනය පරිච්ඡේදයේ ආළවක යක්ෂයා දමනය කිරීමේ දී ඔහු විසින් භාවිත කරන ලද ආයුධ සම්බන්ධයෙන් තොරතුරු දක්වා තිබේ. ''මෙසේ අළවු යක් සුළඟින් වැස්සෙන් පහණ වැස්සෙන් ආයුධ වැස්සක්, අඟුරු වැස්සෙන්, කලල් වැස්සෙන්, අඳුරුයෙන්, මෙ නව වැස්සෙන් බුදුන් නෙරනට නොපොහොසත් වූයේ ය. නන් ආයුධ ගත් අත් ඇති අනේකප්‍රාකාර රූප ඇති යක්ෂයන් විසින් සමාකුල වූ සිව් රඟ සෙනඟින් තෙමෙම බුදුරජාණන් වහන්සේ කරා ගියේ ය. ඒ භූත ගණයෝ අනේකප්‍රාකාර විකාර කොට ගන්වා තළවයි. බුදුන් හිස්මත්තෙන් එන්නවුන් වැන්නහැ එතෙකුදු වුවත් ගිනිගත් ලොහො පිඬහු මැස්සන් සෙයින් බුදුන් ළඟ වන්නට නොපොහොසත් වුහු. එසේ ද වුව යම්සේ බොටඬහි ලා මර දෙව්පිත් ආ වෙලායෙහි මැනැවත් ද මොහු එසෙ නැවතී රැයින් සමහරක් දක්වා ව්‍යාකුල පහළ කොළො මෙසෙ අඩ රැයින් සමහරක් දක්වා ව්‍යාකුල පහළ කොළො මෙසේ අඩ රැයක් පමණ කල්හි නොයෙක් ප්‍රාකාර භය දක්වා බුදුන් සොලවන්නට නොපොහොත් වූහු අළවු යක් කිසි කෙනෙකුදු විසින් නොදිය හැකි චේලායුධ විහිජම් සිතී සතර ආයුධ කෙනෙක් ලෝකයෙහි උත්තමයෝ ශක්‍රයාගේ වජ්‍රායුධය වෙසවුණු මහරජුගේ ගදායුධය යමයාගේ නයනායුධය ආළවකයාගේ චේලායුධය යි'' (අමාවතුර, 1958 ඃ 247-248). සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වන තොරතුරුවලට අනුව රජරට ශිෂ්ටාචාර සමයේ විශාල යුද්ධ ප්‍රමාණයක් පැවැති බව දක්නට ලැබේ. එමෙන් ම එම යුද කටයුතු සඳහා නිෂ්පාදනය කරන ලද යුධ උපකරණ සම්බන්ධයෙන් ද තොරතුරු මෙහි සඳහන් ව තිබේ. පරාක්‍රමබාහු හමුදාවේ නොයෙක් බල ඇණි අතර පූරිකා සන්නද්ධ බල ඇණියක් විය. (ආරියපාල, 1969, 229). සද්ධර්මාලංකාරයේ දුෂ්ට ගාමිණී වස්තුවේ චතුරංගනී සේනාව හා තත්කාලීන ව භාවිත ආයුධ පිළිබඳ ව ඇතමෙකුගේ අවධානය යොමු ව ඇත (සේනානායක, 2012, 160).

### හෙල්ල තල

''දඩයම රජුන් හා ප්‍රභුවරුන් කැප වූ ක්‍රීඩාවක් විය. බහුල වශයෙන් මේ සඳහා භාවිත කරන ලද්දේ ඊ, දුනු, හෙල්ල ආදිය වේ. මෙම උපකරණ භාවිතයෙන් බොහෝ සෙයින් ම දඩයම් කරන ලද්දේ ගෝනා ය. පරාක්‍රමබාහු ගේ නිර්භීත දඩයම් ක්‍රීඩාවක් පැහැදිලි ව විස්තර වේ. රජු බිසව හා අතවැසි පිරිසත් කැටුව දඩයමේ ගිය එක් දවසක දඩයමට සතුන් බහුල සේ පෙනුණු විශාල වනාන්තරයකට පැමිණියේ ය. බිසව එක් පැත්තක නියම තන්හි සිටුවා, හෙල්ල සහ දැල් ගත් දඩයක්කාරයන්ගෙන් වනය වටලවා සතුන් පිටට එලවීම පිණිස හයියෙන් ශබ්ද කරන්නට ඔවුන්ට අණ කළේ ය. හදිස්සියෙන් ම විශාල ගෝනෙක් පඳුරකින් එළියට පැන කුණාටුවකට සමාන සැරෙන් කෙලින් ම බිසව ඉදිරියට ම දුව ගත්තේ ය. මිනිසුන් සියලු දෙනා ම බියපත්ව රජු සහ

බිසව තනියම දමා ඒ මේ අත දිව ගත්හ. බිසව දෙසට දිව ආ මෘගයා දුටු රජු ගෝනා දෙසට පැන තම හෙල්ලයෙන් පහරක් ඇන්නේ ය. තුවාල ලත් ගෝනා රජුට ඇනීමට හිස නැමීය. නමුත් රජු ළඟට එත් ම අං තට්ටුව බිම හෙළමින් ඔහුගේ පා මුල ඇද වැටිණ. මිනිස්සු ආපසු පැමිණ සිදු වී තිබුණු ආශ්චර්ය ය දැක මහත් පුදුමයට පත්ව රජුගේ නිර්භීතකම ගැන ප්‍රශංසා කොට මේ සිද්ධිය අං තට්ටුවේ සුදුසු ලෙස ලියවා එය රජුගේ රත්න භාණ්ඩාගාරයේ තැබූහ'' (ආරියපාල, 1969 : 90).

අභයගිරිය විහාර ව්‍යාපෘතිවලින් සිදු කරන ලද අභයගිරිය ඉවුරු කැණීමේ දී මෙම හෙල්ල තලය හමු වී තිබේ (අභයගිරිය කැණීම් වාර්තාව, 1994). එමෙන් ම එම වර්ෂයේ ම අභයගිරිය විහාර ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද කැණීමෙන් හෙල්ල තලයක් හමු වී තිබේ. මෙහි ලී මිට යොදන වළලු කර දක්නට නොමැති අතර, තලය දෙපැත්ත කඩතොලු වී ඇත (අභයගිරිය කැණීම් වාර්තාව, 1994). අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ස්තූප මළුවේ පස් ඉවත් කිරීමේ දී හෙල්ල තලයක් සොයාගෙන තිබේ. ඇතුළත කුහරය සහිත මිටකට සම්බන්ධ වූ තලයකින් සමන්විත වේ. දිග මි.මී. 45 ක් හා පළල මි.මී. 28 කි. තලය මැද සණකමින් වැඩිවන අතර, දෙපැත්ත තුනී බවකින් යුක්ත වේ. එහි තුඩ යමක වැදීමෙන් පළුලු වී තිබේ. මෙය ලී මිටකට සම්බන්ධ කර භාවිතයට ගත් බව දැකගත හැකි වේ (අභයගිරිය කැණීම් වාර්තාව, 1995).

පොළොන්නරු ආළාහන පිරිවෙන් භූමියේ රත්කොත් වෙහෙර කැණීමෙන් හෙල්ල තල හතරක් හමු වී තිබේ. ඉන් එකක් සම්පූර්ණ තලයක් වන අතර, එහි ලී මිට යෙදූ කොටස ද ඉතා හොඳින් ආරක්ෂා වී තිබේ. අනෙක් තල තුන කොටස් කීපයකට කැඩී ඇත (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1988). ආළාහන පිරිවෙන් භූමියේ පැරණි වීථි කැණීම් කිරීමේ දී හමු වූ හෙල්ල තලයකි. මෙහි හෙල්ල තලය පමණක් ශේෂව ඇත. මිට කොටස විනාශ වී තිබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1996). ආළාහන පිරිවෙන් භූමියේ උතුරු කොටසේ කැණීම් කිරීමේ දී හෙල්ල තලයක් හමු වී තිබේ. මෙහි තුඩ කොටස කැඩී ඇත. මිට සවි කරනු ලබන විල්ල ඉතිරිව තිබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1997).



ඡායාරූප අංක 01 හෙල්ල තලය

**මාංචු කුට්ටම්**

මාංචු කුට්ටම් පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එය භාවිත කොට ඇත්තේ රජයේ ආරක්ෂක නිලධාරීන් විසින් යම් වැරදිකරුවෙකු අල්ලා ගත් පසු ඔහු හෝ ඇය මෙල්ල කිරීම සඳහා ය. අනුරාධපුර හා පොළොන්නරු යුග දෙකෙහි ම මෙරට බොහෝ යුද්ධ ප්‍රමාණයක් සිදු ව තිබේ. එම අවස්ථාවන්වල දී භාවිතයට ගත් මාංචු කුට්ටම් ක්ෂේත්‍රයේ සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හමු ව තිබේ. මහාවංසයේ දක්නට ලැබෙන තොරතුරු අනුව කාශ්‍යප කුමරු තම පියතුමන් වූ ධාතුසේන රජු සෙන්පතියෙක් ලවා නිරුවත් කොට විලංගු ලා පෙරදිගට මුහුණ ලා බිත්තියේ බැද මැටි ගැස්ස වූ බව සඳහන් වේ (මහාවංසය, 38: 109-111).

මහාවිහාර ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද මිරිසවැටිය ස්මාරක අංක 03 කැණීමෙන් මෙම මාංචුවක කොටස හමු වී තිබේ. හමුවන විට ඉතා තදින් මළ බැඳී තිබූ අතර, අල්ප වශයෙන් හායනයට ලක් ව තිබේ. මෙය හමු වූ ස්මාරකයට නැගෙනහිරින් අනුරාධපුර බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකල බන්ධනාගාරය පිහිටා ඇති බැවින් එහි භාවිත කරන ලද්දක් බවට උපකල්පනය කළ හැකි ය (මහාවිහාර කැණීම් වාර්තාව, 2019). පොළොන්නරු

ආළාහන පිරිවෙන් භූමියේ නගර බැම්ම කැණීම් කිරීමේ දී මාංචු කුට්ටම් දෙකක් හමු වී තිබේ. අත් වළල්ලක විෂ්කම්භය මි.මී. 65 කි. එය දම්වැල් පුරුක් සහිත ව දක්නට ලැබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1991).



ඡායාරූප අංක - 02 මාංචු කුට්ටම

**කඩු**

ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ''කඩු'' සම්බන්ධයෙන් අර්ථ කිහිපයක් ලබා දී තිබේ. ''කදලි ක්‍රීඩා - තියුණු මුවහත සහිත කඩුවෙන් කෙසෙල් ගස කැබලි කරමින් කරන ක්‍රීඩාව'' ''අසිග්‍රාහක නායක - රජුට කඩුව පිළිගන්වන අමාත්‍ය'' ''ග්‍රාහක - රජුගේ කඩුව උසුලන්නා'' ''ධාරා - කඩුමුවහත'' (සෝරත හිමි, 2006 : 115). යනුවෙනි එමෙන් ම ''පසඟනා - කඩුව ගෙන මහබෝධිය රකින්නාගේ ප්‍රධානියා'' ''හොට්ටු - කඩු මිටෙහි ගුලිය වැනි කොටස'' ''මුණ - කඩුමුවාත'' ''සරම - කඩුවෙන් යුද කිරීම'' ''ඛඞ්ගශිල්පය - කඩුවෙන් යුද කිරීම උගන්වන ශිල්පය'' ''සිළු - කඩුවෙහි කෙළවර'' (සෝරත හිමි, 2006: 222).

මේ තනතුර පවරා ඇත්තේ සෙට්ඨි කුලයේ ප්‍රධානයාට යි. මින් ඉදිරියට ඇති තනතුරු ලැබුවන්ගේ පෞද්ගලික නම් සඳහන් නො වේ. අසිග්ගාහක තනතුරට පත් සිටු කුල නායකයාගේ නම නැතත් ඔහුගේ පරපුර ගැන කෙටි හැඳින්වීමක් සිංහල බෝධිවංසයේ දක්නට ලැබේ ''දළ්හනේමි නම් සක්විති රජුගේ ගැහැවිරුවන්ද බන්දු පරම්පරාවෙන් බට සිටු කුලෙහි ප්‍රධාන තෙනැත්තන්ට රාත්‍රියෙහි කඩුපත අතින් අල්වා ගෙන බෝධීන් වහන්සේ රක්නා සඳහා කඩුපසගිනා තනතුරු දුන්නේ ය (සිංහල බෝධිවංසය, 213). එමෙන් ම පාලි බෝධිවංසයේ එය හඳුන්වන්නේ ''කඩුපසඟිනා තෙසු සෙට්ඨිකුල ජෙට්ඨස්ස අසිග්ගාහකට්ඨානං'' (පාලි බෝධිවංසය, 1996: 102). නමිනි. ඒ අනුව පාලි බෝධිවංසය අසිග්ගාහක යන නම මෙම කුලය හැඳින්වීම සඳහා භාවිත කොට තිබේ. එමෙන් ම මහාබෝධිවංස ග්‍රන්ථිපදයෙහි ''සෙට්ඨිකුල ජෙට්ඨස්ස, දළ්හ නෙමිත්ත නම් සක්විත්තාගේ, ගැහැවි රුවන්හු පරපුරෙන් බට, සිටු කුලෙහි, දෙටුවනට අසිගාහකකට්ඨානං, දවල් රෑ අසිපත් ගෙන මහබෝ රක්නා කොට තුබුවන් කානදෙටු වරදෙටු මල් බෑ කොට මහබොයට මෙහෙයට ඇර දක්වා දින්'' (ධම්මපාල හිමි, 1985 : 167).

අසිග්ගාහක තනතුර අංගාරක්ෂක තනතුරට සමාන වේ. රජුට ඉතා කිට්ටු අභ්‍යන්තර ආරක්ෂක නිලධාරියකු වූ ඔහු කල්යැමේ දී පැරණි චතුරංගනී සේනාවට ම නායක සෙන්පතියා ද අත්‍යන්ත විශ්වසනීය නිලධාරියා ද විය. අග්‍රබෝධි රජු (ක්‍රි.ව. 598-608) තම බිසවගේ ළඟ ම නෑයෙකු වූ සංඝභද්‍ර අසිග්ගාහක තනතුරට පත් කළේ ය. ඒ විශ්වසනීයත්වය අපේක්ෂාවෙනි. මේ නිසා ම කල්යැමේ දී අසිග්ගාහකයන් කෙතරම් බලපුළුවන්කාරයන් බවට පත් වූයේ ද යත් ඔවුහු රජය පවා පැහැර ගත්හ. සංඝතිස්ස රජ (ක්‍රි.ව. 607-609) සිහසුනෙන් නෙරපා රජ බවට පත් දෙවන මොග්ගල්ලාන කුමාරයා තමන්ට උදව් කළ සෙනෙවියාට අසිග්ගාහක තනතුර දී ඔහු අතින් මැරුම් කැවේ ය. ඔවුහු සේනාධිනායකයන් බව ද එහි ම සඳහන් කොට තිබේ. අසිග්ගාහක සංඝතිස්ස, අසිග්ගාහක ශිලාමේඝ (ක්‍රි.ව. 614-623) යනුවෙන් සඳහන් කොට තිබේ. අසිග්ගාහක සෙන්පතියා පසු කාලය වන විට රටේ පාලන තන්ත්‍රයේ අභ්‍යන්තර බලධාරියෙක් ද විය (ධම්මරක්ඛිත හිමි, 1991 : 61).

යුද අවස්ථාවන්වල දී මුහුණට මුහුණ ලා කෙරෙන සටන්වල දී භාවිත වූ ප්‍රධාන ආයුධය වූයේ කඩුව යි. කඩු ශිල්පය රාජ කුමරුවරුන්ගේ හා කුල දරුවන්ගේ අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක් විය. මහා පැරකුම්බා රජු තම සේවකයෙකුගෙන් කඩුවක්

ඉල්ලා සිටි කල ජම්බුද්වීප පාය්ව නම් කඩුවක් දුන් කල මේ කඩුව සිංහල පටුත්වය ඇත්තක් නො වේ. මෙයි තබා වහා සිංහල පටුත්වය ඇති කඩුවක් ගෙනවයි කර ඇති දැන්වීම අනුව විවිධ වර්ගයේ කඩු භාවිත වූ බව මෙරට නිෂ්පාදිත කඩු වඩා හොඳ තත්ත්වයේ තිබූ බව කියැවේ. අභිධානප්පදීපිකාවේ ''මණ්ඩලග්ගෝ නෙත්තිංසෝ අසි බග්ගෝ සායෝකෝ'' යනුවෙන් කඩු වර්ග හඳුන්වා ඇත. කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙහි සඳහන් කඩු අතර, මණ්ඩලාග්‍ර යනු අග කවපෙත්තක් වැනි ඍජු වූ කඩුවක් බව සඳහන් වේ. දඹදෙණි අස්නේ නිෂ්පාදිත දේශීය අමුද්‍රව්‍ය හැඩය හා ස්වරූපය අනුව කඩුවල වට්ටෝරුවක් දක්වා ඇතත් එය සත්‍ය තත්ත්වයකට වඩා වර්ණනාත්මක විස්තරයක් බව දක්නට ලැබේ. සමහර විට විවිධ දේශවල භටයන් ඔවුන්ට හුරුපුරුදු කඩු භාවිත කරන්නට ඇත. ජාතක අටුවා ගැටපදයේ එකතෝධාර අසි හා උභතෝධාර අසි (එක් දිසාවක මුවහත ඇති කඩු හා දෙදිසාවේ මුවහත ඇති කඩු) සඳහන් ය. උභතෝධාර යනු දඹදෙණි අස්නයේ සඳහන් වන දෑත් කඩු විය හැකි ය. දඹදෙණි අස්නේ විෂ පෙවූ කඩු සඳහන් වෙතත් ඒ බව සනාථ කර ගැනීමට කිසිදු සාක්ෂියක් නැත (කුලතුංග, 2016: 327-328).

කාවන්තිස්ස රජුට සකස් කරන ලද කඩු සම්බන්ධයෙන් සද්ධර්මාලංකාරයේ තොරතුරු සඳහන් වේ. ''එ දවස රජ්ජුරුවෝ බොහෝ නැවැමියන් රැස් කරවා කර්මාන්ත ශාලාවෙහි නොයෙක් ආයුධ කරවති. නිර්මලයෝ ගොස් පිටත සිට නිර්මල නම් යෝධයාණකෙණෙක් අවුය යි. තමන් ආ නියාව රජ්ජුරුවන්ට කියා යවා එන්ට කියව යි කී කල්හි ගොස් රජ්ජුරුවන් වැඳ සිටියහ. නිර්මලයන් ඉතා ම බාලහෙයින් කම්මලැනැවැමි හැමදෙන මෙසේ වූවොත් යෝධයෝ දැයි කෙළිසිනාමුසු බස් කියමින් උන්හ. රජ්ජුරුවෝ එසේ වෙහෙසන නැවැමියන් වළකා නිර්මලයන් කැඳවා මේ කඩුව ගලැ ගා මුවහත් තබව යි දිග සතර රියන් බොල සොළසාඟුල් පුළුල් දෙතිසාඟුල් පීරි නො ගා හැසුවන ම තිබූ කඩු සොළසක් දුන්හ'' (සද්ධර්මාලංකාරය, 2017 : 597). එමෙන් ම කාවන්තිස්ස රජතුමන් පන්සියයක් පමණ කර්මාන්තකරුවන් ගෙන්වාගෙන නොයෙක් ආයුධ කරවති. එවෙලෙහි රජ්ජුරුවෝ ඒ දාථසේනයන් දැක ඔහුගේ බලසම්පන්න බව දැක පීරි ගා මුවහත් නොතිබූ කඩු සැටක් ගෙන මේ සියල්ල ගල ගා මුවහත් තබන්න යැයි අණ කළ බව සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 2017 : 639).

දෙවානම්පියතිස්ස රජුගේ දෙවන අභිෂේකය සිදු කිරීමට අදාළ සියලු උපකරණ භාරතයේ සිට ධර්මාශෝක අධිරාජයා ශ්‍රී ලංකාවට එවූ බව සඳහන් වේ. එම භාණ්ඩ අතර, කඩුව ද තිබූ බව දක්නට ලැබේ. එමෙන් ම පෙර සඳහන් කරන ලද ආකාරයට ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවන ලද අවස්ථාවේ දහ අට ශ්‍රේණියක් කුලයන් අතර, අසිග්ගාහක කුලය ද සිටි බව සඳහන් වේ (මහාවංසය, 12: 27-33). මහාවංසයෙහි කඩු සම්බන්ධයෙන් ඉතා වැදගත් තොරතුරක් හමු විය. එමඟින් පැහැදිලි වන්නේ යුද කටයුතු සඳහා මෙරට නිෂ්පාදනය කරන ලද ආයුධ පමණක් නොව විදේශ රටවලින් ආනයනය කරන ලද අවි ආයුධ ද භාවිත කොට ඇති බව ය. පරාක්‍රමබාහු රජුගේ මහ ඇමතිවරු දිවගොස් බරදවල්ලි ගමේ දී දරුණු යුද්ධයක් කොට පෙර ජය ලැබූ මහා සේනාව සමඟ තමා මහා යුද්ධයක් කොට අවි පහර ලැබූව ද බොහෝ භටයන් මරා වෙහෙසව සිය රටට අභිමුඛ ව නැවැතුණහ. එවිට සතුරු මහා සේනාව දෙගුණයක් උත්සාහවත් වූහ. එකළ පහර ලැබූ ඔවුන් වෙදුන් වෙත ඉදිරිපත් කර පලායන මහා සේනාව දෙස බලා සිනාසෙමින් රණකෙළි කෙළනු කැමති වූ මහාවීර වූ රජු බඞ්ගලතා නැමැති දූතිය රණ බිමට යැවීමට ''මට සිංහළ කඩුවක් දෙන්නැයි සිය අත් ආයුධ භාරකරුට කීවේ ය. ඔහු විසින් නොදැනුවත්කමින් සිංහළ කඩුවකැයි දඹදිව කඩුවක් ගෙන ආ කල සතුරු ඇතුන් බඳින මතැතකු මෙන් ගර්ව සහිත රජු නැවත සිංහළ ද්වීපයෙහි ආයුධයක්

මා අතට දෙන්නට සමතෙක් නැතැයි සිතා තමා අසල සිටි කේසධාතුනායක රක්ඛගේ ද නාථනගර නැමැත්තාගේ ද මුහුණ බැලුවේ ය. ඔවුන් දෙදෙනා මහ රජුගේ ඉඟිය දැන සිංහ පරාක්‍රමයෙන් යුක්තව මහා සේනාව මැදට පැන කඩුපහරින් දෙපලු කර යුද්ධය දවල් පටන් රාත්‍රිය දක්වා සිදු කරන ලදි (මහාවංසය, 70 ፡ 94-110).

කඩුව අසි, ඛග්ග යන වචනවලින් හඳුන්වා තිබේ. කඩුව භාවිත කරන ලද්දේ මුහුණ දී සිදු කරන ලද සටන්වල දී ය. කඩු සහ ධනු ශිල්පය රජ කුමරුන්ගේ සහ කුල දරුවන්ගේ අධ්‍යාපනයේ එක් අංශයක් විය. සිංහලයන් ජාවකයන් පරාජය කළ පසු පැහැරගත් බඩු බාහිරාදිය අතර ඇතුන්, අසුන් ද කඩු සහ අනෙක් නොයෙක් ආයුධ ද බෙර, සක්, ධජ ද විය. රජකු අත වූ ප්‍රධාන ආයුධය කඩුවය. තව ද සිංහල කඩුවක් සහ ජම්බුද්වීප කඩුවක් ද යනුවෙන් රාජකීය කඩු වර්ග දෙකක් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. දෙවැන්න සඳහා කිරිච්චිය, අසිපුත්තක, නික්කරණී යනුවෙන් රාජකීය ආයුධයක් වශයෙන් ද සඳහන් කොට තිබේ. මෙය කේරලයේ අගම්පඩි හමුදාවන්ගේ ද ආයුධය විය. පරාක්‍රමබාහුගේ හමුදාවේ නොයෙක් බල ඇණි අතර, පූරිකා සන්නද්ධ බළ ඇණියක් විය (ආරියපාල, 1969 ፡ 229). පන්සියපණස් ජාතක පොත් වහන්සේ ගේ අන්තර්ගත සෝණක ජාතකයේ රජුගේ මඟුල් කඩුව පිළිබඳ තොරතුරු හමු වේ (ජාතක පොත, 2010፡ 1403).

පූජාවලියේ සඳහන් වන බන්ධුල මල්ලිකා කතා ප්‍රවෘත්තියේ ''මාගේ කඩුපත මැද රවුම් දැයි වාසි කියා කඩුව කොපුවෙන් හයා ගෙන කඩුව මඳක් විචිත්‍ර කොට අහසට අසූරියනක් දමා රජ පිරිස කඩුව අපහිස වැටියේ දෝයි වෙවුලවෙවුලා සිටියේ ය'' (පූජාවලිය, 2014፡ 263). බව ද බන්ධුලසේනාපති විසින් සතුරන් කැළයක් පොලුගසන්නා සේ ලෝදැල් කඩුවෙන් කපා බිම දැමූ බව ද ලිච්ඡවි රජදරුවන් සන්නහා සන්නන්දව පංච ආයුධයෙන් සැරසී සිටි බව ද සඳහන් වේ (පූජාවලිය, 2014፡ 265). එමෙන් ම කෝසල රජු හා අජාසත්ත රජු අතර ඇති වූ යුද්ධවල දී ඔවුන් විසින් භාවිත කරන ලද කඩු පිළිබඳ තොරතුරු දක්නට ලැබේ (පූජාවලිය, 2014 ፡ 271).

පොළොන්නරුව ආළාහන පිරිවෙන් භූමියේ නගර බැම්ම බටහිර කැණීම් කිරීමේ දී කඩුවක කොටසක් සහිත කඩු මිට තුනක් හමු වී තිබේ. මෙය බොහෝ සෙයින් භායනයට ලක් ව තිබේ. දෙපැත්ත ම කොටස් කැඩී ගොස් තිබෙන අතර, තුඩ කොටස ද කැඩී තිබේ. මුවහත කඩතොලු සහිත ය. කඩු මිට දැති දෙකක් සහිත යකඩ මිටකි (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1992). අනුරාධපුර කෞතුකාගාරයේ කඩු තුනක් දක්නට ලැබේ. ඒවා හොඳ මට්ටමේ පවතී (කෞතුකාගාරය අනුරාධපුර). හත්ථිකුච්ඡි විහාර සංකීර්ණයෙන් ද කඩුවක කොටසක් හමු වේ. මෙහි අග කොටස විනාශ වී ඇත (හත්ථිකුච්ඡි කෞතුකාගාරය).



ඡායාරූප අංක - 03 කඩුව

**දුනු සහ ඊතල**

බෝධීන් වහන්සේ සමඟ පැමිණි ධනුර්ධර පවුල් අටේ ප්‍රධානියාට මෙම තනතුර හිමිවි ය. ඔහුට භාර රාජකාරිය වූයේ ස්වකීය පිරිස සමඟ දුනු හී රැගෙන බෝධියේ වසා ලගින්ට එන කපුටු ආදි කුරුල්ලන් පලවා හැරීම යි. ''ධනුග්ගාහකුල ජෙට්ඨස්ස මහාබොධි ආරක්ඛකට්ඨානං'' (පාලි බොධිවංසය, 1996፡ 102). වෙනත් විශේෂණ පද සඳහන් නොකර මෙය බෝධි ආරක්ෂාවට ම යොමු කොට ඇති බව ''මහාබෝධි ආරක්ඛකට්ඨාන'' ''මහබෝ රකිනා'' යන ප්‍රයෝගයන්ගෙන් ප්‍රකට වේ. සිංහල බෝධි වංසයේ එය දක්වා තිබෙනුයේ ''දුනුවා කුලෙහි ප්‍රධාන තැනැත්තන්ට තම පිරිවර දුනුවායන් ගෙනැ දුනු හීතල එලා මහා බෝධියට කපුටන් බැස්ස නො දෙනු කොටැ

මහබෝ රැකී නා තනතුරු දුන්නේ ය'' (සිංහල බෝධිවංසය, 1967: 290). ''ධනුග්ගහකුල ජෙට්ඨස්ස - දුනුවාකුල දෙටුවහට, මහාබොධි ආරක්ඛට්ඨානං, තමා පිරිවර දුනුවායන් ගෙන දුනු හී පැ මහබොයට කපුටුවන් නොබැස්ස දෙනු කොට මහබෝ අරක්නා තැන් දින පැසුළු ඔහු කොඩහර රටින් කොටසරෙහි කොප්පරුන් දුනුවායන් විසින් ඔවුන් හා එක්හූ'' (මහාබෝධිවංස ග්‍රන්ථිපදය, 1985: 168). එහෙත් මේ ධනුග්ගාහකයාත් බෝධියේ වසන, ලගින කුරුල්ලන් එළවීමෙන් පමණක් නතර නො වූ බව ඉන් අනතුරු ව එන ඉතිහාසය විමසීමෙන් තේරුම්ගත හැකි ය. ඒ යුගයේ රජවරුන්ගේ බල ඇණිය හෙවත් සේනාංකය, චතුරංගනි නමින් ප්‍රකට ය. එයින් එකක් පාබල හමුදාව යි. පාහටයෝ ඛඩ්ගධරයන්, ධනුර්ධරයන්, හෙල්ල, කොන්ත, පලිහක්කාරයන් ආදි ආයුධ ගත්තවුන්ගෙන් සමන්විත වූහ (ධම්මරක්ඛිත හිමි, 1991: 68).

ඛඩ්ගධාරියා හෙවත් අසිග්ගාහකයා කෙතරම් බලවතෙක් වූයේ දැයි මිට ප්‍රථම සාකච්ඡා කළෙමු. වරක් ඔහු රජකම පවා පැහැර ගත්තේ ය. මේ ධනුර්ධරයාත් මොන අන්දමකින් හෝ ඊට දෙවැන්නෙක් නම් නො වී ය. ඔහු ද මහරජ වාසල පිටත දී මෙන් ම අභ්‍යන්තරයේදීත් පූර්ණ බලතල සහිත සෙන්පති තත්වයට ම පත් විය. ඔවුහු යුද පෙරමුණේත් ඉදිරියෙන් ම ගිය විශාල වගකීම් භාරයක් දැරූ රජුන්ගේත්, රජයේත් ආරක්ෂාව පිළිබඳ කාර්යයට මුළුමනින් ම ඇප කැප ව ක්‍රියා කළ පිරිසක් වූහ. සේනාධිනායකයා හෝ සෙන්පතියා රජුන් හා එකට අසුන්ගන්නා, එකට සාකච්ඡා කරන, එකට හැසිරෙන ඇතැම් විට සමාන තත්වයෙන් ම සිටින්නෙකි. එහෙයින් ඒ පදවිය ඉතාමත් හිතෛෂී විශ්වාසනීය ළඟ ම නෑදෑයෙකුට පවරාදීමට රජවරු වගබලා ගත්හ. දෙවනපෑතිස් රජුගේ සෙන්පතියා වූයේ තම බෑණා වූ අරිට්ඨ කුමාරයා ය. පශ්චාත්කාලීන රජවරුන් ද මෙය සම්ප්‍රදායයක් කරගත් බව දක්නට ලැබේ (ධම්මරක්ඛිත හිමි, 1991: 68).

දුන්න ආදිකාලීන අවියකි. පාෂාණමය ආයුධ යුගයෙන් පසු මිනිසා නිපදවා ගත් එය, අතින් දමා ගැසූ ආයුධය යාන්ත්‍රිකව වේගයෙන් ඉදිරියට විසි කිරීමට කල්පනා කළ කෙනෙකුගේ ජයග්‍රාහී සාර්ථක නිෂ්පාදනයක් ලෙස හැඳින්වීම යුක්ති සහගත ය. බෝධියේ වසන විහඟුන් පලවා හරිමින් සිටි ධනුර්ධරයා එම වෘත්තියේ සිටින ගමන් ම පොදු ජන සමාජයට ද පිවිස ගත්තේ ය. එමතු ද ඔහු ආචාර්යවරයකු වශයෙන් එම ශිල්පය දියුණු කොට ව්‍යාප්ත කළේ ය. ''ධනුග්ගහ'' ''ධනුර්ධරයා'' ''දුනුවායා'' යන තේරුම දිය හැකි ''ධනුග'' යන පදය ශිලා ලේඛනවල දක්නට ලැබේ. (ධම්මරක්ඛිත හිමි, 1991: 68).

පැරණි පෙරදිග හා අපරදිග සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි විස්මයජනක ධනුර්ධරයෝත්, ශිල්පියෝත් හමුවෙති. නිරන්තර භාවිතයත්, විවිධ පුද්ගලයන්ගේ අභ්‍යාසත් නිසා කිසියම් උපකරණයක හෝ විෂයයක ගුණාත්මක මෙන් ම සංඛ්‍යාත්මක වර්ධනයක් දක්නට ලැබීම ස්වභාවික ය. දුන්නට හා එම ශිල්පයටත් මේ වර්ධන ස්වරූපය හිමි වූ බව දඹදෙණි පැරකුම්බාවන්ගේ (ක්‍රි.ව. 1234-1269) හමුදාවේ. ක්‍රියාත්මක වූ දුනු වර්ගවලින් පැහැදිලි වේ. ''යොන් දුනු, තක්කාරි දුනු, ගල් දුනු, මට්ටම් දුනු, රිදී දුනු, රුවන් දුනු, මාර දුනු, මාරපංගම් දුනු, ලක්කම් දුනු, ඔක්කම් දුනු, කලු දුනු, කලුවැල් දුනු, නඩහඹු දුනු, මැඩහහි දුනු, මිටි දුනු, උස් දුනු, චන්ද්‍රවංක දුනු, සූර්යවංක දුනු, ත්‍රිවංක දුනු, සින්දූරන් දුනු යනා දී දුනුයෙන්'' (දඹදෙණි අස්න, 1960 : 35). ක්‍රියාත්මක වූ දුනු වර්ගවලින් දක්නට ලැබේ.

පළමු කොට ම ප්‍රධාන ආයුධය වූයේ දුන්න සහ ඊතලය දුනුවායා ධනුග්ගහ, ධනුද්ධර යනුවෙන් හඳුන්වනු ලැබේ. ධනුර්ධරයෝ නිරතුරුව ම ශරවර්ෂාවක් වැස්ස වූහ යනු වංසකතාවෙහි බොහෝවිට හමුවන කියමනකි. පරාක්‍රමබාහු රජු විසින් රැස් කරන ලද හමුදාවන් අතර, රාත්‍රී යුද්ධයට පුහුණු කරන ලද බැවින් චන්ද්‍රලෝක ධනුද්ධර

නම් අති දක්ෂ ධනුද්ධර කණ්ඩායමක් විය. සිංහලයන් විස ඊතල කිසි දිනක භාවිත කළා ද යනු ඉතාම සැක සහිත ය. වංසකතාවෙහි විස ඊතල පිළිබඳ සඳහන් වේ. එහෙත් එය රමණ සහ ජාවක හමුදාවන් අතර, පමණි. පරාක්‍රමබාහු රජු විසින් රාමඤ්ඤයට යැවූ තම භටයන්ට විෂ පොවන ලද ඊවලින් සැදුණු පැස වූ තුවාල සුව කර ගැනීම පිණිස ගවශඞ්යන්හි ආරක්ෂා කරන ලද බෙහෙත් සපයන ලදි. 13 වන සියවසේ දී ලංකාව ආක්‍රමණය කළ ජාවකයන් විසින් ඝෝර සර්පයන්ට සම කරන ලද විෂ පෙවූ ඊතලවලින් මිනිසුන් පෙළන ලද බව කියවේ. තව ද මොවුහු මෙසේ විෂ පොවන ලද ඊ යන්ත්‍රයකින් ශීඝ්‍ර ලෙස එකපිට එක විද්දාහ. ගෝකණ්ණක නම් විශේෂ ඊ වර්ගයක් විය. එහි හැඩහුරුකම අනුව මෙසේ නම් කොට තිබේ. මෙම වචනය මහාභරතයෙහි මේ අර්ථයෙහිම යෙදී ඇති සංස්කෘත ගෝකර්ණ යන්නට සමාන ය. මෙතරම් තියුණු උල් සහිත ඊ ඇතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා භාවිත කරන ලදි (ආරියපාල, 1969: 228-229).

එළාර දුටුගැමුණු යුද්ධයේ දී හල්ලුක විසින් දුටුගැමුණු රජු හීයක් විදීමට සැරසුණ ආකාරය පිළිබඳ තොරතුරු සද්ධර්මාලංකාරයේ සඳහන් වේ. ''මේ රජහු මුඛයට විදිමි හීයක් හිඳුවාගෙන කමෙක් ද මහරජ යි හඬ නැගී ය. ගැමුණු රජ ද කඩුතලයෙන් මුඛය පියාගෙන කිමෙක් ද නිවට දෙමළැයි බැණ නැංගේ ය'' (සද්ධර්මාලංකාරය, 2017: 578). එමෙන් ම නේසාද කතා පුවතේ මාගම සිටි වැද්දෙකු සතුව දුනු ඇතුළු වැදි උපකරණ තිබූ බව සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 2017: 762).

පන්සියපණස් ජාතක පොතේ අන්තර්ගත අසදිස ජාතකයේ දුනු ඊතල භාවිත කළ බවට තොරතුරු හමු වේ. ''සෙසු දුනුවායෝ බෝධිසත්වයන් අත දුනු, ඊතල නැති හෙයින් දුනුවායෝ කථා කරන්නාහු ය. අප අත දුනු ඊතල ඉල්ලූවත් කවුරුවත් දුනු ඊතල නොදෙවයි කථා කළහ'' (ජාතක පොත, 2010: 451). එමෙන් ම සෝණක ජාතකයේ ''සියලු අශ්වාලංකාරයෙන් සරසන ලද ශීඝ්‍ර වූ ජව ඇති ඇත් පට හා දුනු හියවුරෙන් උපලක්ෂිත අසරුවන් විසින් නැගෙන ලද සැට දහසක් පමණ අජානීය සෛන්ධව අශ්වයන් ද සිංහසම්, දිවිසම්, වලස්සමින් කරන ලද පිරියම් ඇති නඟන ලද නොයෙක් ධජමාලාවන් ඇති සියලු රථාලංකාරයෙන් කරන ලද සැරහුම් ඇති සන්නහා සන්නද්ධ දුනු ගත් අත් ඇති රථවරුන් විසින් නැගෙන ලද සැට දහසක් පමණ රථසේනාවන් ද'' (ජාතක පොත, 2010: 1406). පූජාවලියේ එන ලිච්ඡවී රජ දරුවන්නේ යුද්ධ හමුදාවේ දුනු ශිල්පය දත් දක්ෂ ශිල්පීන් සිටි බව දක්වා තිබේ (පූජාවලිය, 2014: 265). අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ලංකාරාම කැණීමෙන් ඊතලයක කොටසක් සොයාගෙන තිබේ. ලී මිටකට සම්බන්ධ කර භාවිත කර ඇති මෙම ඊතලය මැද මි.මී.11 කින් යුක්ත ය. තුඩ දක්වා ක්‍රමයෙන් පළල අඩු වේ. තලයේ දෙපැත්ත මුවහත් ය. මිටට සම්බන්ධ කර තිබූ තැනින් කැඩී ගොස් ඇත (අභයගිරිය කැණීම් වාර්තාව, 2000).

**ශූලපාද - උල් කටු**

පොළොන්නරු රාජධානි සමයේ යුධ කටයුතු සඳහා භාවිත යුද්ධෝපාය ක්‍රම අනුව ද තත්කාලීන යකඩ මෙවලම්හි භාවිතයේ ස්වභාවය හා තාක්‍ෂණය පිළිබඳ ව දළ අදහසක් ලබා ගත හැකි ය. සතුරා අඩපණ කිරීමේ ප්‍රධාන යුද්ධෝපාය ක්‍රමයක් ලෙස භාවිත වූ බව දක්නට ලැබේ. යකඩ මෙවලම් භාවිතයෙන් දැවමුවා අරටුවලින් සාදා ගත් උල් හෝ විවිධ උපකරණ තැනීමේ දී කම්මල්වලින් ශේෂවන කොටස් හෝ ඒ වෙනුවෙන් තනා ගත් යවුල් භාවිතය මෙයින් අදහස් වන්නට ඇත. ''ශූල'' යන්නේ හුල් හෙවත් ''උල'' යන අදහස ලබා දෙයි. පා යන්නෙන් පාදය හෙවත් අධාරක යන අදහස ගම්‍ය වේ. ඒ අනුව ශූල පාද යනු අධාරක සහිත උල් ආයුධයක් බව පැහැදිලි ය. එක් උලක් සෙ.මී. 6.5ක් තරම් දිගින් යුත් උල් හතරක් සහිත මෙවැනි උපකරණ කිහිපයක්

පොලොන්නරු පර්යේෂණ මඟින් හමු වී ඇත. මේවා බිම ඇතිරීමේ දී නිරායාසයෙන් ම එක් උලක් උඩට සිටින සේ උල් තුනක් අධාරක පාදයන් ලෙසත් සිටින අයුරින් බිම පතිත වේ. අධාරක පාදයන්ගේ පිහිටීම අනුව ඒ මත වැටෙන දැඩි පීඩනයක් පවා නොසෙල් වී දරා සිටීමේ හැකියාවක් මෙම උපකරණ සතු වේ. මහාවංසයේ එන විස්තරයට අනුව යුද්ධ අවස්ථාවල දී ශූල පාදයන් ඇතිරීමක් පිළිබඳ ව අදහස් වුවත් එහි නිර්මාණ ලක්ෂණ පිළිබඳ ව මෙතෙක් පැහැදිලි රූපයක් නොපැවිතිණි. මහාවංසයේ විස්තර හා සැසඳීමේ දී ශූල පාද නමින් දක්වා ඇත්තේ පොලොන්නරුවෙන් හමු වී ඇති උල් හතරක් සහිත උපකරණයක් බව පැහැදිලි ය. සමූහ වශයෙන් ශූල පාදයන් ඇතිරීමෙන් යුධ පෙරමුණෙන් ගමන් ගන්නා ඇත්, අශ් හා පාබල සේනා පවා අඩපණ කිරීමේ ලා විශාල දායකත්වයක් සපයන්නට ඇති බව එවකට පැවති යුද සංග්‍රාමයන්හි තත්ත්වය අනුව උපකල්පනය කළ හැකි ය. මෙමඟින් තත්කාලීන යකඩ මෙවළම් ශිල්පීන්ගේ තාක්ෂණික ඥානයත්, යුද්ධෝපක්‍රමයන්ගේ දියුණුවත් මනාව ඉස්මතු කරයි (කුමාර, 2009: 11-12).

රක්ඛ අදිකාරිය ද මහරජුගේ උපදෙස් අනුව මිහිරණබිබිල නම් ගමෙහි බිම කැණ එකිනෙක සම්බන්ධ කළ කණු සිටුවා, යෂ්ටි වෙළීමෙන් වෙළු, ඊට වැඩි ප්‍රමාණයෙන් යුත් මහ කණු සිදුරු නැති කොට සිටුවා ඒ මැද නැවත විසි තිස් රියන් පළල් වූ අත් එස් වූ මිනිසුන් සියයකගේ උසට සමාන දිගින් යුත් අගලක් කැණ එහි තියුණු උල් ද කටු ද අතුරා එයින් බැහැර ප්‍රදේශයේ උල් සිටුවා ඒ හා බැඳුණු සිදුරු සහිත වැටක් කොට ඒ මැද ද අගලක් කණවා පෙර මෙන් එහි ද තියුණු උල් හා කටු අතුරා වැටෙන් පිටත ද ජලය තෙක් අගලක් කැණ අගලෙන් පිටත ඊ දෙක තුනක් වැටෙන ප්‍රමාණයට එක පහරින් මහ වනය කප්පවා එහි පිටත සොර මාර්ගයන්හි මහවළවල් කණවා අතුරු නැති වන සේ එහි තියුණු කටු අතුරා හාත්පස දිරූ කොළවලින් හා වැලිවලින් වසා යායුතු මාර්ග සේ පෙනෙන අන්දමින් කරවා එම මඟ එන සතුරු සේනා මුළුමනින් ම නසන්නට හාත්පස සොර මං තනවා විදීමෙහි දක්ෂ දුනුවායන් එහි රඳවා දුර්ගය මැද සිව්මහල් පහයක් කරවා ඒ මත තැන තැන දුනුවායන් යොදවන ලදි (මහාවංසය, 70: 233-250). මහාවංසයේ දක්නට ලැබෙන මෙම යකඩ උල් ශූල පාද නමින් හඳුන්වනු ලැබේ. පොලොන්නරුවේ ඇති දිය අගල හා අනෙකුත් ස්ථාන පුරාවිද්‍යාත්මක කැණීම් කිරීමේ දී උල් හතරක් සහිත යකඩින් නිම කරන ලද යකඩ උල් විශාල ප්‍රමාණයක් හමුව තිබේ. මෙම කටු උල් යුද්ධ කටයුතු පවතින ස්ථානවලට විසි කිරීමෙන් සතුරන්ට ඒවා පෑග වීමට කටයුතු සලස්වා ඇත.

මෙම උපකරණය කුමන ස්ථානයක විසි කළත් එක් උලක් උඩු අතට සිටී මෙහි උපයෝගිතාව වන්නේ යුද්ධය සඳහා පැමිණෙන සතුරන්ගේ පාදයේ ඇණීමට සැලැස්වීම ය. පොලොන්නරුව ආළාහන පිරිවෙන් භූමියේ බටහිර දොරටු කැණීමේ දී ශූලපාද දෙකක් හමු වී තිබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1982). ආළාහන පිරිවෙන් භූමියේ නැගෙනහිර දොරටුවේ කැණීමෙන් ශූලපාද දෙකක් හමු වී තිබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1983).



ඡායාරූප අංක - 04 ශූලපාදය

**ශීර්ෂාවරණ (හිස් වැසුම)**

පොලොන්නරු යුගයේ රජකළ පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ චෝලයන් සමඟ ඉතා බිහිසුණු

යුධ ගැටුම් පැවති බව මහාවංසය ආදී වංසකතාවල තොරතුරු දක්වා තිබේ. එම තොරතුරුවලට අනුව මෙම යුද්ධ කටයුතු සිදු කිරීමේ දී භාවිත කරන ලද විශේෂ ආරක්ෂක ඇඳුම් (ලෝහ ආවරණ) භාවිත කළ බවට තොරතුරු සඳහන් වන අතර, එහි දී භාවිත කරන ලද යකඩ ශීර්ෂාවරණයක් 1988 වර්ෂයේ පොලොන්නරුව ආළාහන පිරිවෙන් භූමියේ රන්කොත් වෙහෙර කැණීමෙන් හමු වී තිබේ. එහි සැකිල්ල පමණක් වර්තමානයේ දක්නට ලැබේ. අනෙක් කොටස් ආවරණය සඳහා තහඩුවක් හෝ වෙනයම් ක්‍රමයක් භාවිත කරන්නට ඇති නමුත් හමුවන විට එහි සැකිල්ල පමණක් ඉතිරිව තිබේ. මෙය වර්තමානයේ පොලොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබේ (ආළාහන පිරිවෙන් කැණීම් වාර්තාව, 1988).



ඡායාරූප අංක - 05 ශීර්ෂාවරණය

### අශ්ව හමුදාව

අනුරාධපුර මුල් යුගයේ සිට ම මෙරට අසුන් සිටි  බවට සාක්ෂි හමු වී ඇත. විශේෂයෙන් ම ඉන්දියාවෙන් ලංකාවට අසුන් ගෙන්වීමත්, අස් වෙළෙඳුන් ගැනත් වංසකතාවල විස්තර දැක්වේ. විශේෂයෙන් ම එළාර දුටු ගැමුණු යුද්ධයේ දී යුද කටයුතු සඳහා අශ්වයන් යොදාගෙන තිබේ. ''රජුගේ ආරක්ෂකයෝ අසුන් පිට නැඟී බලවත් දමිළයන් වට කොට පළවා හැර සතුරන්ගේ හිස සිඳ දුට්ඨගාමණී රජුට පෙන් වූහ. ඇතුන්ගේ හා අසුන්ගේ පා හඬින් ද...'' (මහාවංසය, 25 ඃ 168-172). සූරතිස්ස සමයේ රාජ්‍ය පැහැරගත් සේන ගුත්තික ද පස්වන මිහිඳු සමයේ මෙරට දුර්වල දේශපාලන තත්ත්වය සොළීන්ට දන්වන අස් වෙළෙඳුන් ද ඊට නිදසුන් ය. දොළොස්වන සියවසේ මහාපැරකුම්බා රාජ්‍ය සමයේ නැව්වලින් ලංකාවට අසුන් ගෙන ආ බව සඳහන් වේ. මෙසේ අනුරාධපුර හා පොලොන්නරු යුග දෙකෙහි ම යුද්ධවල දී හමුදාවේ අශ්වාරෝහකයන් සිටි බවට තොරතුරු සඳහන් වේ. මහා පැරකුම්බා සටනින් පරාජය වී රුහුණුට පලාගිය මානාභරණ සිය අසුන් හා ආයුධ අතහැර යාමත් දකුණු ඉන්දියාවේ සටන් සඳහා මහා පැරකුම්බා විසින් ජගත් විජය සෙනවියා යටතේ යැවූ අශ්ව සේනාවක් සිටි බවත් සඳහන් වේ (කුලතුංග, 2016ඃ 322).

අනුරාධපුර යුගයේ බොහෝ යුද කටයුතුවල දී අශ්වයන් හා ඇතුන් යොදාගෙන ඇති බව වංසකතා තොරතුරු මඟින් දැකගත හැකි ය. විශේෂයෙන් ම අනුරාධපුර හා පොලොන්නරු යුග දෙකෙහි ම අශ්වයන් සඳහා සකසන ලද අශ්ව ලාඩං දක්නට ලැබේ. අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ථූපාරාම පෙත්මග කැණීමෙන් මෙම අශ්ව ලාඩමක් හමු වී තිබේ (අභයගිරිය කැණීම් වාර්තාව, 2013). මහාවිහාර ව්‍යාපෘතියෙන් සිදු කරන ලද ථූපාරාම දාන ශාලාව කැණීමෙන් අශ්ව ලාඩමක් හමු වී තිබේ. මෙය බොහෝ සේ දිරාපත් වී ඇත. එහි එක් පසෙක සිදුරු තුනක් දැකගත හැකි වේ (මහාවිහාර කැණීම් වාර්තාව, 2017). අංක 17 පොකුණ සංරක්ෂණය කිරීම් කටයුතු අතර, පස් ඉවත් කිරීමේ දී මෙය හමු වී තිබේ. අශ්වයෙකුගේ පාදවල කුර ගෙවීම වැළැක්වීම පිණිස යොදාගත් ලාඩමක කොටසකි (මහාවිහාරය කැණීම් වාර්තාව, 2018).

### ඇත් හමුදාව

අනුරාධපුර යුගයේ එළාර දුටුගැමුණු ද්වන්ද සටනේ ඇත් හමුදාවක් සිටි බව දක්නට ලැබේ. ''පැනයන එළාර රජු දුටු දුට්ඨගාමණී රජු එහි දී බෙර හසුරුවා යෝධයන් රැස්කරවා ඔවුන් ඇමතුවේ ය.

රැස් වී මාගේ වචනය අසව් මා හැර වෙනත් කිසිවෙකු එළාර රජු නොමැරිය යුතු ය. මෙසේ කියා රජු සන්නද්ධව, සන්නද්ධ වූ කණ්ඩුල ඇතුපිට නැගී පලා යන එළාර රජු ලුහුබැන්දේ ය. කණ්ඩුල ඇතා ජයකුංචනාදයක් කොට එළාර රජු හා පබ්බත ඇතු ලුහුබඳිමින් දකුණු දොරටුව වෙත ආවේ ය. සතුරන් මැඩීමේ අති දක්ෂ වූ ඇතුන් පිට නැගී රජුන් දෙදෙනාම උපමා රහිත ලෙස සෝභමාන වූහ. නගරයේ දකුණු ප්‍රදේශයේ දී රජවරු දෙදෙනා යුද කළහ. ඇත්තු දෙදෙනාද ඇතුන් සමඟ යුද්ධ කළහ. යෝධයෝ යෝධයන් සමඟ ද ධනුර්ධරයෝ ධනුර්ධරයන් සමඟ ද පාබළ හමුදාව පාබළ හමුදාව සමඟ ද යුද්ධ කළහ. රජුගේ ආරක්ෂකයෝ අසුන් පිට නැගී බලවත් දමිළයන් වටකොට පළවාහැර සතුරන්ගේ හිස් සිඳ දුට්ඨගාමණී රජුට පෙන්වූහ. ඇතුන්ගේ හා අසුන්ගේ පාහඬින් ද මිනිසුන්ගේ බියජනක උද්ඝෝෂණයෙන් ද සයුරු රළපහරින් මිහිකත බිඳින්නාක් මෙන් ද මහ හඬක් නැගිණ'' (මහාවංසය, 25 : 162-172).

ශ්‍රී ලංකාවේ අලි ඇතුන් යුද්ධ කාර්යයෙහි දී ඉන්දියාවේ ඇතුන්ට වඩා ප්‍රබල හා ශරීර ප්‍රමාණයෙන් විශාල මෙන් ම නුවණින් ද වැඩි බව සඳහන් ය. පොලොන්නරු යුගයේ දී ලංකාවේ ඇති වූ සටන් පිළිබඳ විස්තරවල දී ඇතුන් යොදාගත් බවට අවස්ථා ගණනාව දී වාර්තා වී ඇත. මහා පැරකුම්බාගේ හමුදා ගජබාහුට විරුද්ධ ව සටනට යෑමේ දී ඇතුන්ට සන්නාහ යෙදූ බව එක් නිදසුනකි. එසේ ම එතුමාගේ ලංකාධිනාථ සෙනෙවියා ගජබාහු හා සටනේ දී හස්ත්‍යාරෝහකයන් බිම හෙළා ඇත. මානාභරණ පැරකුම්බාට පරාජය වී රුහුණුට පලා ගිය කල්හි දමා ගිය ඇතුන් අසුන් හා බොහෝ ආයුධ පැරකුම්බාට අයත් වී ඇත. මහ පැරකුම්බා සටන් සඳහා කලා ඔයෙහි සෑද වූ පාලම ඇතුන්ට හා අසුන්ට යා හැකි පරිදි ඉදිකර තිබීම තවත් නිදසුනකි (කුලතුංග, 2016 : 322).

අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද දීඝපාසාන කැණීම් භූමියෙන් මෙම හෙන්ඩුව හමු වී තිබේ. මෙම හෙන්ඩුව සමඟ හමු වී ඇති යකඩ විල්ල ඊට ම සම්බන්ධ බව දක්නට ලැබේ. හෙණ්ඩුවේ මිට සවි කිරීමේ දී මිට පැලීම වළක්වා ගැනීමට යකඩ විල්ල භාවිත කරන්නට ඇත. අනුරාධපුර හා පොලොන්නරු යුගවල හමු වූ යකඩ නිර්මාණ අතර සුවිශේෂී නිර්මාණයක් ලෙස හඳුනාගත හැකි ය. වෙනත් කිසිඳු ස්ථානයකින් ඇතුන් පාලනය කිරීම සඳහා භාවිත කරන ලද හෙන්ඩු හමු වී නැත (අභයගිරිය කැණීම් වාර්තාව, 2000). යුද ජයග්‍රහනවලින් පසුව සාමකාමී රාජ්‍යයක් ඉදිරියට පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දේශපාලනික තොරතුරු අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය.

**සමාලෝචනය**

අනුරාධපුර රාජධානිය වරින්වර ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයට හසුවන අවස්ථාවේ දී දුර්වල වන පාලකයන් සිය ආරක්ෂක සංවිධානය පවත්වා ගැනීම සඳහාත්, රාජකීය ආරවුල්වලින් වෙන්වී ම පිණිසත්, තෝරා ගත්තේ පොලොන්නරු රාජධානිය යි. අනුරාධපුර රාජධානිය දකුණු ඉන්දීය ආක්‍රමණවල දී දුර්වල වූ විට එහි නිදහස උදෙසා සටන් වැදුණු අවස්ථාවල රජරට රාජ්‍යයට ප්‍රබල සහායක් දුන් ප්‍රදේශයක් වශයෙන් වැදගත් වේ. අනුරාධපුර යුගයේ මුල් කාලයේ සිට ම පොලොන්නරුව අසල පිහිටි විජිත නගරය ප්‍රාදේශීය ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත් වේ. එළාර රජු විසින් වර්ධනය කළ මෙම බලකොටුව දුටුගැමුණු රජුට අල්ලා ගැනීමට සිව් මසක් ගත වූ බව ප්‍රකට ය. මෙවැනි ප්‍රබල බලකොටුවක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය යුධ උපකරණ හා ආයුධ නිෂ්පාදනයට සිංහල හා ද්‍රවිඩ පිරිසගේ සහාය රජුට ලැබෙන්නට ඇති අතර රාජකීය අනුග්‍රහය ද විශාල වශයෙන් යකඩ කර්මාන්තයට ලැබෙන්නට ඇති බවට සැක නැත. දුටුගැමුණු රජු වර්ධනය කළ විජිතපුර බලකොටුව අනුරාධපුර පාලකයන්ගේ

අනුග්‍රහය ඇති ව නිරන්තරයෙන් යුද්ධයට සූදානමින් තිබූ බලකොටුවක් බව අනුමාන කළ හැකි ය. උතුරින් පැමිණි ආක්‍රමණවලට අනුරාධපුරය නිරන්තරයෙන් ගොදුරු වූ අතර ඉන් ආරක්ෂාවීමට උපක්‍රමයක් ලෙස රජවරු සිය හමුදා සමඟ පොලොන්නරුවට පලායාම සිදුකළ බව දක්නට ලැබේ. සොළීන් වර්ෂ හැත්තෑවකට ආසන්න කාලයක් රජරටින් හා රුහුණෙන් එල්ල වන ආක්‍රමණවලින් ආරක්ෂා වීමටත්, මහවැලි ගඟේ තොටුපළවල් රැකගැනීම සඳහාත් විශාල පරිශ්‍රමයක් දරන්නට ඇත. ඔවුන්ට ආරක්ෂක තත්ත්වය ශක්තිමත් කරගැනීමට අවශ්‍ය ආයුධ නිෂ්පාදනයට, ප්‍රදේශයේ යකඩ කර්මාන්තය විශාල සහායක් ලබාදෙන්නට ඇත. සොළී බලය අවසන් කළ විජයබාහු රජු සිය අගනුවර වශයෙන් තෝරාගත්තේ, තමන්කඩුව ප්‍රදේශය යි. මීට හේතුවන්නට ඇත්තේ, රජ රටින් එල්ල වන ආක්‍රමණ මැඩලීමට හා රුහුණු පාලකයන් සතු ස්වතන්ත්‍රතාව මැඩලීමට මෙහි සිට වඩාත් පහසුවීම නිසාය. ප්‍රදේශය ආශ්‍රිත යුධ කටයුතු වෙනුවෙන් යකඩ කර්මාන්ත තිබූ ප්‍රදේශවලින් නොමඳ සහායක් රජුට ලබාදෙන්ට ඇත. අනෙක් අතට විජයබාහු, පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල රාජකීයන්ගේ විදේශීය ආක්‍රමණ පිළිබඳ තොරතුරු ඉතිහාසය හා බැඳේ. එහි දී සංග්‍රාම කටයුතු වෙනුවෙන් අවි ආයුධවල අවශ්‍යතාවය බෙහෙවින් පවතින්නට ඇතැයි සිතිය හැකි ය. මෙකී අවශ්‍යතාව සපුරාලීමට ද්‍රවිඩ මෙන් ම සිංහල පිරිස් ද යකඩ නිෂ්පාදනයේ බහුල ව යෙදෙන්නට ඇත.

රජු පාලන තන්ත්‍රයේ ප්‍රධානියා වූ අතර පරිපාලන හා ආක්‍රමණ අවස්ථාවල දී සාමූහික ව මුහුණදීම සඳහා ප්‍රාදේශීය ආරක්ෂාව ශක්තිමත් කළ බව පෙනේ. මේ යටතේ ඇත්, අස්, රිය, පාබල යන චතුරංගනී සේනාවක් පොලොන්නරු අවධිය වන විටත් රාජ්‍ය ආරක්ෂක සේවයේ යෙද වූ අතර යුධ හා නාවුකවලට අමතර ව රටවැසි සේනාව නමින් ආරක්ෂක සේනාවක් වූ බව පෙනේ. රාජ්‍ය ආරක්ෂාව හා සාමය පවත්වා ගැනීමටත්, සිංහාසනය හිමිකර ගැනීමටත්, නිරන්තරයෙන් ම පැමිණෙන දේශීය හා විදේශීය ආක්‍රමණ මැඩ පැවැත්වීමටත් යුධ බලය හා ආයුධ සන්නද්ධ හමුදා පාලනයක් තිබිය යුතු ය. ඒ අනුව, රාජ්‍ය ආරක්ෂක විධික්‍රම අනුව ආයුධ හා සන්නාහ ක්‍රමයන්ගේ වැදගත්කම පැහැදිලි ය. සාහිත්‍ය මූලාශ්‍රවලින් හා අනුරාධපුර, පොලොන්නරු පැරණි නගරයෙන් හමුවන සාධක අනුවත් භාවිත කළ යුධ මෙවලම් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය.

## මූලාශ්‍රය


*අභයගිරිය විහාර ව්‍යාපෘතිය අනුරාධපුර*, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

*අමාවතුර*, (1958) ඤාණතිලක, හිමි, කේ. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ආරියපාල, ඇම්.බී. (1969) *මධ්‍යකාලීන ලංකා සමාජය*, මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ආළාහණ පිරිවෙන, *පොලොන්නරුව*, කොළඹඃ මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

කුමාරස්වාමි ඒ, (2015). *මධ්‍යකාලීන සිංහල කලා*, දෙහිවලඃ තිසර ප්‍රකාශකයෝ සහ මුද්‍රණය.

කුලතුංග ටී.ජී, (2014). *පුරාණ අභයගිරි විහාරය*, කොළඹඃ මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

*ජාතක පොත*, (2010). එම්.ඩී. ගුණසේන සමාගම ප්‍රකාශනය, කොළඹඃ එම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මරක්ඛිත හිමි, ඩබ්ලිව්, (1991). *ශ්‍රී මහා බෝධීන් වහන්සේ*, කොළඹඃ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

පියරතන හිමි, ඩබ්ලිව්. (සංස්) (1999). *පාලි මහාබෝධිවංසය*, වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.

*පූජාවලිය* (සංස්), (2014). ඒ.වී. සුරවීර, පිටකෝට්ටෙඃ සිසාරා ප්‍රින්ට්වේ ප්‍රයිවට් ලිමිටඩ්.

*මහාවංසය*, (2012). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවිහාර ව්‍යාපෘතිය අනුරාධපුර*, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

*සද්ධර්මාලංකාරය*, (2017). පඤ්ඤාලෝක හිමි, එම්. නුගේගොඩ: කොලිටි ප්‍රින්ටර්ස්.

*සිංහල බෝධිවංශය*, (සංස්) 2018. සිරිපාල, වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

සේනානායක, ආර්. (2012). *සද්ධර්මාලංකාරයේ නිරූපිත ජන ජීවිතය*, පී.බී.ත ප්‍රතිභා උපසර ශාස්ත්‍රීය සංග්‍රහය (සංස්) සේනානායක රංජිත්, පූංචිබොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සෝරත හිමි, ඩබ්ලිව්. (1999). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*, ද්විතීය භාගය, වැල්ලම්පිටිය, චතුර මුද්‍රණාලය.